# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2034/25 - 2017 අගෝස්තු මස 30 වැනි බදාදා - 2017.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32(ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව, ජුඩෝ ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා ජුඩෝ සංගමයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් එකී ශ්‍රී ලංකා ජුඩෝ සංගමයේ කටයුතු තවදුරටත් පවත්වා ගෙනයාම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන සාමසුන්දර ඒකනායක රාජවර්ධන තෙන්නකෝන් මුදියන්සේලාගේ සමන් ප්‍රියන්ත බණ්ඩාර මහතා 2017.08.30 දින සිට නිසි බලධාරියා වශයෙන් පත්කරන අතර ශ්‍රී ලංකා ජුඩෝ සංගමයේ 2017 වර්ෂය සඳහා නව නිලධාරී මණ්ඩලය පත් කර ගැනීම පිණිස නිළවරණය කැඳවීම හා පැවැත්වීමටත් මෙයින් නියම කරමි.

නීතිඥ දයාසිරි ජයසේකර (පා. ම.),
ක්‍රීඩා අමාත්‍ය.

2017 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

09- 353/1

---

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32 සහ 33 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32(ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව, අත්පන්දු (හැන්ඩ් බෝල්) ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා අත් පන්දු (හැන්ඩ් බෝල්) සංගමයේ ලියාපදිංචිය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන අතර, තාවකාලික කාර්ය ක්‍රමයක් වශයෙන් එකී ශ්‍රී ලංකා අත් පන්දු (හැන්ඩ් බෝල්) සංගමයේ කටයුතු තවදුරටත් පවත්වා ගෙනයාම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන සාමසුන්දර ඒකනායක රාජවර්ධන තෙන්නකෝන් මුදියන්සේලාගේ සමන් ප්‍රියන්ත බණ්ඩාර මහතා 2017.08.30 වැනි දින සිට නිසි බලධාරයා වශයෙන් පත්කරන අතර ශ්‍රී ලංකා අත්පන්දු (හැන්ඩ් බෝල්) සංගමයේ 2017 වර්ෂය සඳහා නව නිලධාරී මණ්ඩලය පත් කර ගැනීම පිණිස නිළවරණය කැඳවීම හා පැවැත්වීමට මෙයින් නියම කරමි.

නීතිඥ දයාසිරි ජයසේකර (පා. ම.),
ක්‍රීඩා අමාත්‍ය.

2017 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

09- 353/2

1A - G 26183 — 12 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*